ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2512/48 - 2026 ඔක්තෝබර් මස 31 වැනි සෙනසුරාදා - 2026.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

ජාතික පොලිස් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ වන ව්‍යවස්ථාව පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ වන ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2341/51 හා 2023.07.20 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයේ උපලේඛනයෙහි අංක 4 යටතේ ප්‍රකාශයට පත්කර ඇති විධිවිධාන, අංක 2436/12 හා 2025.05.16 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් සංශෝධනය කරන ලදී. එලෙස සංශෝධනය කරන ලද අංක 2436/12 හා 2025.05.16 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයේ උපලේඛනයෙහි අංක 4 යටතේ ප්‍රකාශයට පත්කර ඇති විධිවිධාන, පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මෙයින් නිශ්චිතව නියම කරනු ලැබේ.

උපලේඛනය

I වන තීරුව	*II වන තීරුව*	*III වන තීරුව*
බලතල පවරන ලද නිලධරයන්	*පොලිස් නිලධරයන් කාණ්ඩ*	*පවරන ලද බලතල*
4. නියෝජ්‍ය පොලිස්පතිවරුන්	(අ) පොලිස් පරීක්ෂක සහ පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන්; (පොලිස් ස්ථානභාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාස වල ස්ථානාධිපතිවරුන් හැර) (ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්.	(අ) ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කාර්ය පටිපාටි ප්‍රකාරව තම පරිපාලන බල ප්‍රදේශය තුළ ස්ථානමාරු කිරීම; (ආ) තම පරිපාලන බල ප්‍රදේශය තුළ වැඩ තහනම් කිරීම ඇතුළු විනය පාලනය (සේවයෙන් පහකිරීම හැර); (ඇ) තම පරිපාලන බල ප්‍රදේශය තුළ විනය ශාලා දඩුවම් නියම කිරීම.

02. තවද ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2341/51 හා අංක 2023.07.20 දිනැති සහ 2436/12 හා 2025.05.16 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයන්හි අනිකුත් විධිවිධාන (සංශෝධිත විධිවිධාන හැර) නොවෙනස්ව පවතී.

03. මෙම බලය පැවරීම 2026.11.27 දින සිට ක්‍රියාත්මක විය යුතු බවට මෙයින් තීරණය කරනු ලැබේ.

04. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඊ. ඩබ්ලිව්. එම්. ලලිත් ඒකනායක,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2026 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ 07,
බෞද්ධාලෝක මාවත,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
9 වන ගොඩනැගිල්ල,
ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

EOG 10 - 0396